# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත

---

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 25 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 මාර්තු මස 27 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ **කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 5.00**

# 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 25 වන දින]

එල්.ඩී.–ඕ. 4/2002.

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියක් සංස්ථාපනය කිරීම සඳහා ද, අභියාචන සම්බන්ධයෙන් ඒ අධිකාරයේ බලතල හා ඒ අධිකාරය විසින් පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය නිශ්චය කොට දැක්වීම සඳහා ද, ඒ හා සම්බන්ධව හෝ ඊට ආනුෂංගික කටයුතු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ පිහිටුවනු ලබන (මෙහි මින් මතු "විනිශ්චය අධිකාරය" යනුවෙන් සඳහන් කරනු ලබන), පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය රාජ්‍ය නිලධරයකු වශයෙන් අවුරුදු විස්සකට වැඩි පළපුරුද්දක් හෝ නීතිඥ වෘත්තියේ අවුරුදු දහයක පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුත්තේ ය. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සංයුතිය.

(2) සභාපතිවරයා ඇතුළුව විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ගේ ධූර කාලය අවුරුදු තුනක කාලයක් විය යුත්තේ ය.

3. විනිශ්චය අධිකාරයට - විනිශ්චය අධිකාරයේ බලතල.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIIඅ පරිච්ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්,

කරන ලද නියමයකට හෝ තීරණයකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් විභාග කොට විනිශ්චය කිරීමට බලය ඇත්තේ ය.

CM—013945—1,000 (2012/02)

අභියාචන කාර්ය පටිපාටිය.

4. (1) අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් කවර හෝ රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු විසින් ඒ නියමය හෝ තීරණය ඔහුට ලැබුණු දින සිට සති හතරක් ඇතුළත ලියවිල්ලකින් වූ අභියාචනයක් විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය.

(2) එම නියමය හෝ තීරණය වෙනස් කරවා ගැනීමට, සුළු වශයෙන් වෙනස් කරවා ගැනීමට හෝ අවලංගු කරවා ගැනීමට, අවස්ථාවෝචිත පරිදි අතෘප්තියට පත් රජයේ නිලධරයා හෝ පොලිස් නිලධරයා අපේක්ෂා කරන්නේ කවර හේතු මත ද යන්න, (1) වන උප වගන්තිය යටතේ විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන අභියාචනයෙහි සංක්ෂිප්තව හා නියත ආකාරයෙන් ගෙනහැර දක්වනු ලැබිය යුතු අතර, එය ඒ නිලධරයා විසින් අත්සන් කරනු ලැබිය යුත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සහ ජාතික පොලිස් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු බව.

5. (1) 4 වන වගන්තිය යටතේ අභියාචනයක් ලැබුණු විට, අභියාචන විනිශ්චය අධිකාරය විසින් ඒ බව අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු අතර, අභියාචනයේ පිටපතක් අප්‍රමාදව අදාළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) එය ඉදිරිපත් කරනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එම අභියාචනයට හෝ අභියාචනයට එරෙහිව කොමිෂන් සභාවේ විරෝධතා, විනිශ්චය අධිකාරය විසින් සලකා බලනු ලැබීම සඳහා විනිශ්චය අධිකාරය හමුවට යැවිය යුත්තේ ය.

මූල් බැල්මට පෙනෙන අතෘප්තිකර කාරණයක් පවත්නා බවට විනිශ්චය අධිකාරය සෑහීමට පත්වීම.

6. විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයේ සඳහන් හේතු සලකා බැලීමේ දී මූල් බැල්මට පෙනෙන අතෘප්තිකර කාරණයක් පවත්නා බවට සෑහීමට පත්වීමෙන් පසුව, විනිශ්චය අධිකාරය විසින් –

(අ) ඒ අභියාචනය භාරගනු ලැබිය හැක්කේ ය ;

(ආ) අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් වාර්තාවක් කැඳවනු ලැබිය හැක්කේ ය ;

(ඇ) විනිශ්චය අධිකාරයේ මතය අනුව අභියාචනයේ දැක්වෙන හේතුවලට සම්බන්ධ යම් ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කරන ලෙස, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවට නියම කරනු ලැබිය හැක්කේ ය ;

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ ගණයේ වෙනත් යම් රජයේ නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට බලපෑමක් සිදු වී තිබීමට ඉඩ ඇතැයි විනිශ්චය අධිකාරය සලකන්නේ ද ඒ වෙනත් නිලධරයාට ඒ පිළිබඳ නිවේදනයක් කර, ඒ අභියාචනය සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කිරීමට ඒ නිලධරයා කැමති කරුණු ඇත්නම් ඒ කරුණු ඒ නිවේදනය ඔහු වෙත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැක්කේ ය.

අභියාචන පිළිබඳ කටයුතු කිරීම.

7. මේ පනත යටතේ විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක්, ඒ අභියාචනය ලැබුණු දින සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුත්තේ ය.

විනිශ්චය අධිකාරයේ තීරණ.

8. (1) විනිශ්චය අධිකාරයේ තීරණය සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු අතර, එම තීරණය අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ද අභියාචනය ඉදිරිපත් කළ රජයේ නිලධරයා හෝ පොලිස් නිලධරයා වෙත සහ විනිශ්චය අධිකාරය විසින් 6 වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ නිවේදනයක් යවනු ලැබූ වෙනත් යම් රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු වෙත ද දැනුම් දෙනු ලැබිය යුත්තේ ය. විනිශ්චය අධිකාරයේ තීරණය බහුතරයේ තීරණය විය යුත්තේ ය.

(2) විනිශ්චය අධිකාරය විසින් ගන්නා ලද තීරණයක් අවසානාත්මක ⸤⸥ තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය.

විනිශ්චය අධිකාරයේ නිලධරයන් හා සේවකයන්.

9. (1) විනිශ්චය අධිකාරයේ බලතල ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා, අධිකරණ සේවා කොමිෂන් සභාව විමසා පත්කළ හැක්කේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවකයන් ඉවත් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පැවරෙන්නේ ය.

විනිශ්චය අධිකාරයට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකි බව.

10. විනිශ්චය අධිකාරයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ විනිශ්චය අධිකාරයේ විධානය මත කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.